# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2124/27 – 2019 මැයි 23 වැනි බ්‍රහස්පතින්දා – 2019.05.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 2055/58 හා 2018.01.26 වැනි දින දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූ ද, 2018 අංක 21 හා 2018.01.25 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 2055/58 හා 2018.01.26 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2018 අංක 21 හා 2018.01.25 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2017/UD/183.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DS/GFG/L&L/05/101.
2019 මැයි මස 21 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පෙට්ටිගලවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ජීඒ/ජීඑෆ්ජී/2017/820 හා 2017.09.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0014 ක් පමණ**
උතුරට: පෙට්ටිගලවත්ත ඇළ; නැගෙනහිරට: පෙට්ටිගලවත්ත ඇළ පාර; දකුණට: යූ. ලියනගේ හිමිකම් කියන ඉඩම සහ කැබලි අක්ෂර බී; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0208 ක් පමණ**
උතුරට: කැබලි අක්ෂර ඒ, පෙට්ටිගලවත්ත ඇළ පාර සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම; නැගෙනහිරට: යූ. ලියනගේ හිමිකම් කියන ඉඩම; දකුණට: පරණ මාතර පාර සහ කැබලි අක්ෂර සී; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම.

03. **කැබලි අක්ෂර 'සී' – ප්‍රමාණය: හෙක්. 0.0027 ක් පමණ**
උතුරට: කැබලි අක්ෂර බී සහ යූ. ලියනගේ හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: පරණ මාතර පාර; දකුණට: කැබලි අක්ෂර ඊ, ඩී සහ අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත; බටහිරට: අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**04. කැබලි අක්ෂර 'ඩී' – සෙහොයිස්ගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0069 ක් පමණ**

උතුරට: පරණ මාතර පාර, කැබලි අක්ෂර සී සහ ඊ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඊ; දකුණට: කැබලි අක්ෂර ඊ සහ අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත; බටහිරට: අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත.

**05. කැබලි අක්ෂර 'ඊ' – ප්‍රමාණය: හෙක්. 0.0041 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර සී සහ පරණ මාතර පාර; නැගෙනහිරට: අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත; දකුණට: කැබලි අක්ෂර එෆ් සහ සිමෙන්ති කාණුව; බටහිරට: අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත සහ කැබලි අක්ෂර ඩී.

**06. කැබලි අක්ෂර 'එෆ්' – සෙහොයිස්ගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0045 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඊ සහ අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත; නැගෙනහිරට: අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත; දකුණට: සමුද්‍ර මාවත සහ කැබලි අක්ෂර ජී; බටහිරට: කැබලි අක්ෂර ඊ සහ අගුළුගහ ගමගේ හේමන්ත හිමිකම් කියන සෙහොයිස් ගෙවත්ත.

**07. කැබලි අක්ෂර 'ජී' – ප්‍රමාණය: හෙක්. 0.0048 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර එෆ්; නැගෙනහිරට: සමුද්‍ර මාවත; දකුණට: වෙරළ උද්‍යානය සහ කැබලි අක්ෂර එච්; බටහිරට: වෙරළ උද්‍යානය.

**08. කැබලි අක්ෂර 'එච්' – සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0022 ක් පමණ**

උතුරට: සමුද්‍ර මාවත සහ කැබලි අක්ෂර ජී; නැගෙනහිරට: වෙරළ උද්‍යානය; දකුණට: මුහුද; බටහිරට: වෙරළ උද්‍යානය.

06 - 90

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 මැයි මස 28 වැනි දින අංක 1812/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 167 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/94.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
WGSWD&EIP/ACQ/KB/09.
2019 මැයි මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535 ඒ බෙල්ලන්විල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොරලැස්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො 9464 හා 2018.10.29 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අංක 188 – වැල්ලබොඩකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0171**

උතුරට: කැබලි අංක 187; නැගෙනහිරට: කැබලි අංක 24 සහ 189; දකුණට: කැබලි අංක 189 සහ 27; බටහිරට: කොළඹ පාරේ වරි. අංක 215, 211/7 යන ඉඩම් සහ කැබලි අංක 187.

06 - 91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.